# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1844/71 - 2014 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2014.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත**

3(6) (අ) සහ (ආ) වැනි වගන්තිය යටතේ වූ නියමය

2001 අංක 02 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3(6)(අ) සහ (ආ) වැනි වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අවසන් වශයෙන් තවත් එක් වරක් පමණක් මනාපය ප්‍රකාශ කිරීමේ කාලය දීර්ඝ කිරීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, පහත සඳහන් නියමයන්ට යටත්ව මෙයින් නියම කරමි.

1. 1983.08.01 වැනි දිනට පෙර රාජ්‍ය සේවයේ පත්වීම් ලබා එදිනට සේවයේ නියුක්තව සිටි නිලධාරිනියන් විසින් මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනකට පෙරද, එම දිනය 2014.12.31 ලෙසින් ද,

2. නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් හා පොලිය එකවර ගෙවිය යුතු බවද, එය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 ට අනුකූල විය යුතු බවට ද,

3. නිලධාරිනිය මියගොස් ඇත්නම් අදාළ දායක මුදල හා පොලිය ප්‍රදානයෙන් එකවර අඩු කළ යුතු බවත් නිලධාරිනිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල හා පොලිය අය කල යුතු බවත් නියම කරමි. තවද මෙම නියමය ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ඇති තැනැත්තියන්ට පමණක් සීමා වන බවද තවදුරටත් නියම කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

01 - 754/1


1A - PG 1909 — 1060 (2014/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත

5 අ වැනි වගන්තිය යටතේ වූ නියමය

2008 අංක 32 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1953 අංක 44 දරන පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ 5 අ වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අවසන් වශයෙන් තවත් එක් වරක් පමණක් වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට මනාපය ප්‍රකාශ කිරීමේ කාලය දීර්ඝ කිරීමට රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම, පහත සඳහන් නියමයන්ට යටත්ව මෙයින් නියම කරමි.

1. 1983.08.01 වැනි දිනට පෙර පාසල් ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතින් ආවරණය වන පාසල්වල පත්වීම් ලබා එදිනට සේවයේ නියුක්තව සිටි නිලධාරිනියන් විසින් මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනකට පෙරද, එම දිනය 2014.12.31 ලෙසින් ද,

2. නිලධාරිනිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් හා පොළිය එකවර ගෙවිය යුතු බවද, එය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 ට අනුකූල විය යුතු බවට ද,

3. නිලධාරිනිය මියගොස් ඇත්නම් අදාළ දායක මුදල හා පොළිය ප්‍රදානයෙන් එකවර අඩු කළ යුතු බවත් නිලධාරිනිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල හා පොළිය අය කල යුතු බවත් නියම කරමි. තවද මෙම නියමය ශ්‍රී ලාංකීය පුරවැසිභාවය ඇති තැනැත්තියන්ට පමණක් සීමා වන බවද තවදුරටත් නියම කරමි.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

01 - 754/2

---

## 2010 අංක 8 දරන වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත

10 වැනි වගන්තිය යටතේ වූ නියමය

ඉහත සංශෝධන පනතෙහි විධිවිධානයන්ට අනුව 2010 අගෝස්තු මස 17 වැනි දිනට පෙර අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය 2014.12.31 වැනි දින වශයෙන් මින් නියම කරමි.

මෙම නියමයන් 1970 අංක 18 දරන වැන්දඹු අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා එහි සංශෝධන සම්බන්ධයෙන් ද බල පැවැත්වේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

01 - 754/3

**2010 අංක 9 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් (සංශෝධන) පනත**

9 වැනි වගන්තිය යටතේ වූ නියමය

ඉහත සංශෝධන පනතෙහි විධිවිධානයන්ට අනුව 2010 අගෝස්තු මස 17 වැනි දිනට පෙර අදාළ සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම් පෑමේ දිනය 2014.12.31 වැනි දින වශයෙන් මින් නියම කරමි.

මෙම නියමයන් 1998 අංක 60 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු (සන්නද්ධ හමුදා) පනත හා එහි සංශෝධන සම්බන්ධයෙන් ද බල පැවැත්වේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2013 ක් වූ දෙසැම්බර් මස 31 වැනි දින,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දී ය.

01 - 754/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.